**චාවකච්චේරි නගර සභාව - 2021**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

චාවකච්චේරි නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට චාවකච්චේරි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**----------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලොචිත වර්ෂයේ රු. 18,380,130 ක් වටිනා ව්‍යාපෘති 21 ක් ක්‍රියාත්මක කර නොතිබුණද, එයට අදාල වවුචර් සකස්කර විවිධ ණය හිමි යටතේ ගිණුම් ගතකර තිබීමෙන් ජංගම වගකීම් වැඩියෙන්ද අතිරික්තය අඩුවෙන්ද දක්වා තිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවන පරිදි ව්‍යාපෘති අදාල කාලය තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | දේශීය ණය සංවර්ධන අරමුදලට 2022 වර්ෂයේ ගෙවිය යුතු රු. 3,244,350 ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දැක්විය යුතුවුවද, ණය ප්‍රාග්ධන යටතේ දක්වා තිබීමෙන් ණය ප්‍රාග්ධනය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් බදු ලේඛනය (Form 29) අනුව සභාවේ 2021 වර්ෂයේ හිඟ වරිපනම් බදු රු. 6,184,799 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබුණු වරිපනම් ශේෂය රු. 6,364,785 වූයෙන් රු. 179,986 ක වෙනසක් නිරීක්ෂණ විය. | මෙම වැරද්ද නිවැරදි කිරීමට කටයුතු කරමින් පවති. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයයන් | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ඉඩම් හා ගොඩනැගිලි 10 | 226,100,000 | ඉඩම් ඔප්පු පැවරුම් නියෝග | සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,715,189 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 47,711,960 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු** | | |
| එකතු වටිනාකමක් වූ රු. 14,147,726 ක හිඟ වරිපනම් හා බදු ශේෂය වර්ෂ 03 ක් ගතවී ඇතත්, අයකර ගැනීමට සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණ විය. තවද, හිඟ ආදායම් වලට අදාලව කාල විශ්ලේශනයක්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෘදුකාංගවල අඩුපාඩු හේතුවෙන් හිඟ ශේෂය වාර්ෂිකව වෙන්කර ගත නොහැකිව ඇත. වාර්ෂික තොරතුරු ලැබෙන පරිදි සකස්කර දෙන මෙන් අදාල ආයතනය වෙත දන්වා ඇත. ඉදිරියේදි වර්ෂිකව තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 01 ක් ඉක්මවූ රු.294,005 ක් හිඟ බදුකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල කඩ කාමර සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණද එය ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැත. | අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම කඩිනම්කළ යුතුය |
| **(ඇ) වෙනත් ආදායම්** | | |
| රු.1,187,870 ක හිඟහිටි වෙනත් ආදායම් ශේෂය වර්ෂ 02 ක් ඉක්මවී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 1,187,870 ක් ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ලද හිඟ ශේෂයකි. එය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. | හිඟ මුදල් අයකර ගැනීමේ කටයුතු කඩිනම්කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරන අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු. 89,893,761 ක් වටිනා ස්ථාවර තැන්පත් සහා සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට කටයුතු නොකර පොලි ආදායම් ඉපයීම සඳහා බැංකුවේ තැන්පත් කර තිබුණි. | අදාල ස්ථාවර තැන්පත් සංවර්ධන වැඩසටහන් සඳහා ලැබුණු රු. මිලියන 24 ක් ස්ථාවර තැන්පත් මුදල ආපසු ලබා ගැනීම සඳහා ගරු. ආණ්ඩුකාරතුමාගේ G/NPC/A4/LG/Approval/80/2019 සහ 2019.10.14 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවති. | සභා අරමුදල් උපරිම මට්ටමෙන් සංවර්ධන ක්‍රියාකාරකම්වල යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක ණය**<br>සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 04 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු. 88,478 ක ආපදා ණය ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරින් එම ප්‍රදේශවල පදිංචි වී නැති බව ප්‍රාදේශීය ලේකම් විසින් තහවුරු කර ගැනීමෙන් පසු කපා හැරීමට කටයුතු කරන ලෙස සභා අනුමැතිය ලැබී ඇත. | හිඟ ණය ශේෂය අදාල කාල පරිච්ඡේදයේ අයකර ගැනීමට ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| **(ආ) සේවක ඇප**<br>2020 මාර්තු 07 වන දිනැති අංක PF/01/2017 (අ) අංක දරන පළාත් මූල්‍ය චක්‍රලේඛය ලිපියට අනුව සභාව විසින් ලබා ගෙන තිබූ නිලධාරීන් 24 දෙනෙකුගේ ඇප මුදල රු. 172,489 ක් අදාල නිලධාරීන් දැනට සභාවේ සේවය නොකරන බැවින් ආපසු ගෙවීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සේවක ඇප මුදල් ආපසු ගෙවීම සඳහා අදාල අයට ලිපි යවා ඇති අතර, මෙතෙක් රු. 41,892 ක් ආපසු ගෙවා ඇත. ඉතිරි මුදලද ආපසු ගෙවීමට කටයුතු කර ඇත. එසේ ආපසු භාර ගැනීමට ඉදිරිපත් නොවන මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. | ඇප මුදල් ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. |